

## වන පළතුරු අතර රජා

# පලු



*Manikara hexandra* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන පලු ශාකය Sapotaceae හෙවත් ලාවුළු කුලයට අයත්ය. ඉංග්‍රීසි භාෂාවෙන් Ceylon iron wood / Wedge leaved ape (කෙඳඇර) ලෙසද, දෙමළ භාෂාවෙන් Kannupala ලෙසද, සංස්කෘත භාෂාවෙන් Rajadana ලෙසද හඳුන්වයි. මෙම ගසෙහි අරටුව ඉතා ශක්තිමත් බැවින් හා මෙරට දේශියව දැකිය හැකි බැවින් Ceylon iron wood යන නමින්ද හඳුන්වයි. දකුණු ආසියාවේ දැකිය හැකි මෙම ශාකය අප රටේ වියලි කලාපයේ ඇතැම් ප්‍රදේශවල දැකගත හැකිය.

ඉතා හෙමින් වැඩෙන මෙම ශාකය සදාහරිත ලෙස හැඳින්වුව ද, ලංකාවේදී නම් කොළ හැලෙනු දැකිය හැකිය. ගසක් මීටර් 5 - 20 ක් අතර උසට හා මීටර් 1 - 3 වට ප්‍රමාණයකින් වැඩේ. කඳේ පොත්ත කුඩා කුඩා පැළුම් දරන රළු පොත්තකින් යුක්තය. එය අළු හා කළු මිශ්‍ර වර්ණයක් ගනී. සමහරක් ගස්වල කඳට සාපේක්ෂව අඩංගු ප්‍රධාන අතු ප්‍රමාණය අඩුය. පත්‍ර හැඩයෙන් තරමක් විවිධ වේ. බොහෝ විට ඕවලාකාර වන අතර අණ්ඩාකාර පත්‍රද දරයි. ඇතැම් විට පත්‍රය අග කෙළවර මදක් දෙකට බෙදී ඇත. දිගින් සෙන්ටිමීටර් 5 - 10 හා පළලින් සෙන්ටිමීටර් 3 - 7 ක් වන අතර පත්‍ර නටුව සෙන්ටිමීටර් 1 - 2 පමණ වේ. මෙම පත්‍ර තද කොළ පැහැතිය. මේවා මාරුවෙන් මාරුවට පිහිටන පරිදි සකස්වන අතර අතුවල අගට වන්නට ඒකරාශි වී ඇත. මල් කහ පැහැයට හුරු සුදු පැහැතිය. මේවා අතු අග තනි තනිව ඇතිවේ. මල් හට ගැනීම සාමාන්‍යයෙන් සිදුවන්නේ අගෝස්තු - දෙසැම්බර් කාලයේදිය.



ඵලය ඕවලාකාර වන අතර දිගින් සෙන්ටිමීටර් 1 - 1.5 පමණ වේ. ලපටි කාලයේ කොළ පැහැති වන අතර ඉදුණු පසු කහ පැහැතිය. ගෙඩිවල කිරි තරමක් අඩංගුය. එක් ඵලයක බීජ එකක් හෝ දෙකක් අඩංගුය. වර්ණයෙන් දිලිසෙන තද දුඹුරු පැහැතිය. ව්‍යාප්තිය සිදු වන්නේ මෙම බීජ මගිනි.

මෙම ගෙඩි තද පැණි රසකින් යුත් ඉතා ප්‍රණීත පළතුරකි. සමහරවිට වෙළඳපොලෙහි විකිණීමට තබා තිබෙනු දැකිය හැකිය. පලතුරු මැස්සාගේ කීටයන්ගෙන් පහසුවෙන් හානි පැමිණිය හැකි අතර ඉක්මණින් නරක් වීමද සිදුවේ. රසයෙන් පමණක් නොව ගුණයෙන්ද ඉහළ පලු ගෙඩි කැල්සියම්, යකඩ, විටමින් A හා ක්ෂුද්‍ර පෝෂක වලින්ද බහුලය. දකුණු ආසියාවේ පකිස්ථානය වැනි සමහරක් රටවල්වල ඵල ලබාගැනීම සඳහා පලු වගාකරන අවස්ථා ඇත. පලු ගසෙහි කොළ, පොතු, ඵල හා ඇට ආයුර්වේද හා දේශීය වෛද්‍ය විද්‍යාවේදී යොදාගනී. තුවාල, අතිසාරය, ආමාශයේ ඇතිවන ආම්ලික ගතිය හා පණුරෝග සඳහා පලු ගෙඩියේ පොත්ත යොදාගන්නා අතර, බඩේ අමාරුව, ආහාර අරුචිය, අපස්මාරය, කැස්ස සමඟ ලේ පිටවීම හා ලාදුරු රෝගය සඳහා අමු ගෙඩි යොදා ගනී. පලු ඇට තුවාල හා සමෙහි ඇතිවන සුදු පාට පැල්ලම් සඳහා ගුණදායක බවද පැවසේ.

පලු පලතුරක් ලෙස අතීතයේ සිට අද දක්වා භාවිත කලත් දැන් දැන් එය එතරම් සුලභ නොවන තත්ත්වයට පත්වී ඇත. එයට හේතුව දැව ලබාගැනීමට ගස් කැපීමත්, ඵල ඇති කාලයේ ඵල නෙලීම සඳහා අතු කැපීමත්ය. මෙය ඉතා හෙමින් වැඩෙන ශාකයක් බැවින් අතු කැපූ පසු නැවත පළමු තත්ත්වයට වැඩීමට ඉතා දීර්ඝ කාලයක් ගත වේ. ඇතැම් විට දළු නොදමාම මැරී යා හැකිය. එමනිසා අළුතින් ගස් සිටුවීම තබා තිබෙන ගස් ටිකවත් රැකගත යුතුය. ඒ සඳහා ඵල හටගන්නා කාලයේදී ලොකු අතු කපා හෙලීමෙන් වැළකිය යුතුය.

**වී. ජී. ජී. අරුණ යසපාලිත,**

කෘෂිකර්ම උපදේශක, සේවාගම, පොළොන්නරුව